සවියෙන් පෙරට - අපි එකට

e-ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
10	භූගෝල විද්‍යාව	2	3. ලෝකයේ ප්‍රධාන කෘෂි කාර්මික භූමි පරිභෝග වර්ග

සැකසුම:නෙලූපා නුවංගනී ගමගේ

බප/හො/තක්ෂිලා මහා විද්‍යාලය

ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ගවල ව්‍යාප්තිය සහ ඒවායේ විශේෂිත ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පරිච්ඡේදයේ අරමුණ වේ.

කෘෂිකර්මය යනු

කෘෂිකර්මය යන්නට බෝග වගාව මෙන්ම සත්ව පාලනය ද අයත් ය. පාදක කර ගන්නා අරමුණු අනුව කෘෂි කෘෂිකර්මය ප්‍රධාන කාණ්ඩ දෙකකට බෙදිය හැකියි. එනම්:

- **පාරිභෝගික හෙවත් යැපුම් කෘෂි කෘෂිකර්මය**

පරිභෝජන අවශ්‍යතා මූලික අරමුණු කොටගත් කෘෂිකර්ම

- **වානිජ හෙවත් ව්‍යාපාරික කෘෂිකර්මය**

වාණිජ අවශ්‍යතා මූලික අර අරමුණ කොට ගත් කෘෂිකර්මය

කෘෂිකාර්මික භූමි පරිභෝගය යනු

මිනිසා විසින් කෘෂිකාර්මික කටයුතු සඳහා භූමිය පරිහරණය කිරීම කෘෂිකාර්මික භූමි පරිභෝගය ලෙස හඳුන්වයි.

- ලොව ජනතාවගෙන් වැඩි කොටසකගේ ප්‍රධාන ජීවනෝපායනය කෘෂිකර්මය වන හෙයින් කෘෂිකාර්මික කටයුතු සඳහා මිනිසා විවිධ ස්වරූපයෙන් සහ අරමුණින් භූමිය පරිහරණය කර ඇති ආකාරය දකින්නට ලැබේ.

අතීතයේ සිට මේ දක්වා කෘෂිකර්මයේ වැදගත්කම අඩු නොවීමට හේතු

- ලෝක ජනතාවට අවශ්‍ය ආහාර, එනම් භෝග වර්ග මෙන්ම සත්ව නිෂ්පාදනද, පානීය අවශ්‍යතාද සැපයීම.
- දියුණුවන කාර්මික ක්ෂේත්‍රයට අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම.
- ලෝක ජන සංඛ්‍යාවෙන් බහුතර සංඛ්‍යාවක් කෘෂි අංශයේ ‍ක්‍රියාවල නිරත වීම.
- ලෝක වෙළඳාමේදී කෘෂි නිෂ්පාදන වැදගත් තැනක් ගැනීම

3.1 රූපය
විවිධ කෘෂි භෝග ආශ්‍රිත නිෂ්පාදන

වී වගාව

- ආසියානු බොහෝ රටවල ජනතාවගේ ප්‍රධාන ආහාරය වේ.
- ලෝකයේ වී වගා කරන ප්‍රධාන ප්‍රදේශ කොටස් දෙකකි.
    1. ආසියාවේ වී වගා කරන ප්‍රදේශ
    2. ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශ

01. ආසියාවේ වී වගා කරන ප්‍රදේශ (ප්‍රධාන රටවල්)

- තායිලන්තය
- චීනය
- ඉන්දියාව
- ඉන්දුනීසියාව
- ජපානය
- පකිස්තානය
- බංග්ලාදේශය
- මියන්මාරය
- ශ්‍රී ලංකාව

02. ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශ

- ඉතාලියේ පෝ ගංගා නිම්නය
- අප්‍රිකාවේ නයිල් ඩෙල්ටාව
- උතුරු ඇමරිකාවේ මිසිසිපි හා සැක්‍රමැන්ටෝ නිම්නය
- ඕස්ට්‍රේලියාවේ මරේ ඩාලිං ගංගා නිම්නය
- මැඩගස්කරය

3.1 සිතියම

ලෝකයේ වී වගා කරන ප්‍රධාන ප්‍රදේශ

වී වගාව ව්‍යාප්ත වීම කෙරෙහි බලපා ඇති සාධක

- **27°C** ක් පමණ උෂ්ණත්වය
- **2000mm** පමණ වර්ෂාපතනයක් ද
- දියලු පස,
- තැනිතලා ප්‍රදේශ

වර්ෂා ජලයෙන් මෙන්ම වාරි ජලසම්පාදනය මගින්ද වී වගාව සිදු කෙරේ. දුෂ්කර බිම්වල ද හෙල්මළු ක්‍රමයට වී වගා කරනු ලැබේ.

වී වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ

- ❖ කුඩා ගොවි බිම්වල වී වගා කිරීම
- ❖ ඇතැම් රටවල ව්‍යාපාරික මට්ටමින් විශාල ගොඩබිම්වල වගා කිරීම
- ❖ ඉන්දියාව, ජපානය, ඇමරිකා එක්සත් ජන ජනපදය, චීනය, පකිස්තානය, තායිලන්තය, වියට්නාමය, වැනි රටවල් වාණිජ පදනමකින් වී වගා කිරීම
- ❖ ආසියාතික රටවල් බොහෝ විට ශ්‍රම සූක්ෂම වගාවක් වන අතර ආසියාවෙන් බැහැර ප්‍රදේශවල විශාල වශයෙන් යන්ත්‍ර සූත්‍ර භාවිත කිරීම, මෑතකාලීනව ආසියාවේද යන්ත්‍ර සූත්‍ර භාවිතයට ගැනීම
- ❖ වර්තමානයේ දී ඓන්ද්‍රීය පොහොර භාවිතය කෙරෙහි වැඩි අවධානයක් යොමුවීම.

  නිදසුන් - ශ්‍රී ලංකාව
- ❖ ජාන තාක්ෂණය උපයෝගී කොටගෙන විවිධ රෝග වලට ඔරොත්තු දෙන හා කෙටි කෙටිකාලීන අස්වැන්න ලබාදෙන බීජ වර්ග භාවිත කිරීම
- ❖ විශේෂ ගුණාංගවලින් යුත් සහල් නිෂ්පාදනය කිරීම

  නිදසුන් - රත් සහල්
- ❖ සහල් ආශ්‍රිත විවිධ නිෂ්පාදන සැකසීම හා ඇසිරීම සඳහා නව ශිල්ප ක්‍රම භාවිතය

  නිදසුන් - සහල් පිටි, පාන් හා බිස්කට් යනාදී නිෂ්පාදන
- ❖ බොහෝ විට සහල් වෙළදාම ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවලම සිදුවීම

ආසියානු ප්‍රදේශයේදී වී වගාවේ ප්‍රධාන ලක්ෂණ

- වී වගා බිම් ඉතා ජනාධික ප්‍රදේශ ආශ්‍රිතව පිහිටා තිබීම සහ වී වගාවෙන් යැපෙන ජන සංඛ්‍යාව ඉතා විශාල වීම

  උදා: චීනයේ චොංකින් සහ යැංසි ඩෙල්ටාව, ජාවා දිවයින
  බංග්ලාදේශයේ ඩෙල්ටා ප්‍රදේශය

- වගාවේ ප්‍රධාන අරමුණ පාරිභෝගික අවශ්‍යතා සපුරා ගැනීමය

  * ආසියාවේ වී නිෂ්පාදනයේ වැඩි කොටසක් ඒවා නිෂ්පාදනයය කරන රටවලම ආහාර අවශ්‍යතා සපුරා ගැනීමට යොදා ගැනේ.

  * මේ නිසා අන්තර්ජාතික සහල් වෙළදාමට එයින් එකතු වනුයේ සුළු ප්‍රමාණයකි.

  * අතිරික්ත නිෂ්පාදනය වුවද නිර්යාත කරනුයේ අසල් අසල්වැසි හෙවත් කලාපීය රටවල්වලටමය.

- ශ්‍රම සූක්ෂම වගාවක් වීම

  * ආසියානු රටවල වී වගාව යාන්ත්‍රීකරණය වී ඇත්තේ අඩු මට්ටමකින් වන අතර එය ශ්‍රම සූක්ෂම වගාවක් ලෙස සිදු කෙරේ.
  * යාන්ත්‍රීකරණය අඩු වීමට හේතුවී ඇත්තේ ගොඩබිම කුඩා වීම විශාල යන්ත්‍ර භාවිතයයි.

ව්‍යාපාරික ධාන්‍ය වගාවේ ලක්ෂණ

- ව්‍යාපාරික ධාන්‍ය වගා බිම්වල වගා කරනුයේ තනි හෙවත් ඒකලබෝගයකි. බොහෝ ප්‍රදේශයන්හි ප්‍රධාන බෝගය ලෙස තිරිඟු වගා කරන අතර එය වසන්ත තිරිඟු සහ ශිශිර තිරිඟු යනුවෙන් වර්ග කරයි.

- ව්‍යාපාරික ධාන්‍ය වගා බිම් ප්‍රමාණයෙන් ඉතා විශාල ය. වගා බිම්වල පරාසය හෙක්ටයාර 240 - 600 අතර වේ. එක්සත් ජනපදයේ සාමාන්‍ය වගා බිමක් හෙක්ටයාර හාරසියයක් පමණ වේ.

- ගොවිපළ යාන්ත්‍රීකරණය අධිකය වගා බිම සැකසීමේ මූලික අවස්ථාවේ සිට අස්වනු නෙළා ගැනීම සහ ඇසිරීම දක්වා සියලු කටයුතු යන්ත්‍ර සූත්‍ර ඇසුරින් සිදු කරයි.

තිරිඟු වගාවේ කැපී පෙනෙන ලක්ෂණ

- බිම් ඒකකයකට ලැබෙන අස්වැන්න අඩු වුවද තිරිඟු වගා ප්‍රදේශවල ජන සංඛ්‍යාව අඩු වීම නිසා ඒක පුද්ගල අස්වනු ප්‍රමාණය වැඩි වීම.
- තිරිඟු ඒක බෝග වගාවක් වීම හා වගා බිම් විශාල වීම
- නිෂ්පාදනය වැඩි කර ගැනීම සඳහා දියුණු තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතය

  උදා - ජාන තාක්ෂණය , පාංශු සංරක්ෂණ ක්‍රම,
- තිරිඟු සඳහා ලොව පුරා පැතිරුණු වෙළඳ පොළක් තිබීම
- වී වගාව හා සැසඳීමේදී මහා පරිමාණ වශයෙන් යාන්ත්‍රීකරණයට භාජනය වීම
- වැඩි ඵලදාවක් සහිත තිරිඟු වර්ග භාවිතය

  උදා - නොරින් 10 තිරිඟු විශේෂය
- විවිධාකාරයෙන් සැකසූ ආහාර ලෙස තිරිඟු පරිභෝජනය කිරීම

අන්තර්ජාතික වෙළඳාමේ තිරිඟු වැදගත්වීමට හේතු

- ✓ලෝක වෙලදාම සම්බන්ධ වන ප්‍රධාන ධාන්‍ය වර්ගය වීම හා වැඩිපුරම භාවිතා වන ධාන්‍ය වර්ගය වීම.
- ✓අනෙකුත් ධාන්‍ය වලට වඩා තිරිඟු පිටි වලින් විවිධ ආහාර වර්ග සකස් කළ හැකි වීම.
- ✓උත්තරාර්ධ ගෝලයේ අස්වනු නෙලන කාලයක් දක්ෂිණාර්ධ ගෝලයේ අස්වනු නෙලන කාලයක් දෙකක් වීම නිසා වසර පුරා ම වෙළෙඳ පලට තිරිඟු සැපයිය හැකි වීම.
- ✓තිරිඟු වගා කෙරෙන රටවල අඩු ජනසංඛ්‍යාව නිසා ලෝක වෙළඳපලට තිරිඟු වැඩිපුර සැපයිය හැකි වීම.

ජනතාව අතර තිරිඟු ආහාරයක් ලෙස ජනප්‍රිය වීමට හේතු

- අඩු මිලකට ලබා ගත හැකි වීම
- වෙළඳපොළ ප්‍රමාණවත් පරිදි වසර පුරා තිරිඟු පැවතීම
- විවිධාකර ලෙස තිරිඟු ආහාර සැකසිය හැකි වීම
- ක්ෂණික ආහාර ලෙස පරිභෝජනයට ගත හැකි වීම

1
2
3
4
5
6
7
8
9
10
1. චීනය
2. ඉන්දියාව
3. රුසියාව
4. ඇමරිකා එක්සත් ජනපදය
5. ප්‍රංශය
6. කැනඩාව
7. පකිස්තානය
8. ඕස්ට්‍රේලියාව
9. ආර්ජන්ටිනාව
10. තුර්කිය

තිරිඟු වගා කරන ප්‍රධාන රටවල් කිහිපයක නිෂ්පාදනය 2009 - 2010



තිරිඟු වගාව සඳහා බලපාන භෞතික සාධක

- **300mm – 500mm** අතර වර්ෂාපතනය
- පැළ වැඩෙන කාලයේ සිසිල් තෙත් දේශගුණය
- හොඳින් ජලය බැසයන තැනිතලා බිම්
- චර්නෝසම් පස

තිරිඟු වගාව සඳහා බලපාන මානුෂ සාධක

- ප්‍රාග්ධන ආයෝජනය කිරීමේ හැකියාව
- නවීන තාක්ෂණය
- යන්ත්‍ර සූත්‍ර භාවිතය
- නව බීජ වර්ග භාවිතය
- කෘමිනාශක සහ කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය

වතු කෘෂිකර්මය

මනා සංවිධානයකින් හා කළමනාකාරීත්වයකින් යුක්තව පුහුණු ශ්‍රමය භාවිතා කරමින් අපනයනය මුල් කරගෙන විශාල වතු වල සිදු කෙරෙන බෝග වගාව වතු කෘෂිකර්මය ලෙස හැඳින්වෙයි .

- තේ
- රබර්
- කපු
- කපු
- කෝපි
- කොකෝවා
- පොල්

වතු කෘෂිකර්මයේ විශේෂ ලක්ෂණ

- විශාල වතු වශයෙන් ව්‍යාප්ත වීම හා මුළුමනින්ම ව්‍යාපාරික ස්වරූපයක් ගැනීම
- වතු වගාවේ දී දේශීය ශ්‍රමය මෙන්ම විදේශීය ශ්‍රමයද භාවිතා වීම
- පුහුණු ශ්‍රමය භාවිතා වීම හා විධිමත් ශ්‍රම සංවිධානය
- කෘෂිකාර්මික ක්‍රමයක් වුවද කාර්මික ලක්ෂණ ද පෙන්නුම් කිරීම
- විදේශ විනිමය ලබා දෙන අපනයන බෝග වීම

  උදා- ශ්‍රී ලංකාවේ තේ, රබර්, පොල්
- බොහෝ රටවල වතු කෘෂිකර්මය විදේශිකයන් විසින් ආරම්භ කර තිබීම

තේ වගාව

- චීන ජාතිකයින් විසින් තේ වගාව සොයා ගන්නා ලදී.
- බටහිර ජාතීන් විසින් වතු කෘෂිකර්මය යටතේ ලෝකයේ විවිධ කලාපවලට හඳුන්වා දෙන ලදී.
- ආසියානු කලාපය තේ නිෂ්පාදනයේ ප්‍රමුඛයා වේ.
- ලොව බහුලව භාවිතා කරන පාන වර්ගයකි.

1. චීනය
2. ඉන්දියාව
3. කෙන්යාව
4. ශ්‍රී ලංකාව
5. තුර්කිය
6. වියට්නාමය
7. ඉන්දුනීසියාව
8. ජපානය
9. ආර්ජන්ටිනාව
10. ඉරානය
1
2
3
4
5
6
7
8
9
10

තේ වගාව සඳහා බලපාන සාධක

- 15°C - 27°C අතර උෂ්ණත්වය
- **1900mm 5400mm** දක්වා වූ වාර්ෂික වර්ෂාපතනය,
- ලෝම හා ලැටරයිට් පස,
- මද බෑවුම් සහිත ප්‍රදේශ,
- පුහුණු ශ්‍රමය

තේ වගාවේ විශේෂ ලක්ෂණ

- දිගු කාලයක් අස්වැන්න ලබා දෙන බෝගයක් වීම.
- විශාල වතු හා කුඩා වතු ලෙස ව්‍යාප්තව පැවතීම.
- මනා කළමනාකාරිත්වයක් හා විධිමත් ක්‍රම සංවිධානයක් පැවතීම.
- අස්වැන්න වැඩිකර ගැනීම සඳහා විවිධ තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිත කිරීම.
- බීජ තේවලට වඩා රිකිලි තේ ගස ප්‍රචලිත වීම.
- විවිධ රසයෙන් හා අලංකාර ඇසුරුම් ඇසුරුම්වලින් වලින් යුතුව වෙළඳපොලට ඉදිරිපත් කිරීම.

නිදසුන් - කළු තේ, හරිත තේ, ලෙමන් ටී, සුදු තේ, කහ තේ

විවිධ අයුරින් සකසන ලද තේ නිෂ්පාදන

තේ අලෙවිය වැඩි කරගැනීමට අනුගමනය කරන උපාය මාර්ග

- විවිධ රසයෙන් යුතු නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරිම.
- ඖෂධීය ගුණයෙන් යුතු නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරීම.
- ප්‍රචාරණයක් ලබා දීම.
- අලංකාර ඇසුරුම්වලින් යුත් නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරිම.
- නිෂ්පාදන සඳහා විවිධ වර්ණ භාවිතය.
- නිෂ්පාදනවල ගුණාත්මක බව වර්ධනය කිරීම.

රබර් වගාව

- බ්‍රසීලයේ කැලෑ බෝගයකි.
- දකුණු හා අග්නිදිග ආසියානු හා අප්‍රිකානු රටවල වතු වගාවක් ලෙස ව්‍යාප්ත විය.
- 1890 දී යුරෝපයේ මෝටර් රථ කර්මාන්තයේ ඇති වූ දියුණුවත් සමඟ රබර් ඉල්ලුම වැඩි විය.
- ලෝකයේ ස්වභාවික රබර් නිෂ්පාදනයෙන් 95% ක් දකුණු හා අග්නිදිග ආසියානු රටවල් සපයයි.
- රබර් වතු වගාවක් ලෙස දෙවෙනි වන්නේ තේ වලට පමණි.



3.4 සිතියම

ලෝකයේ රබර් වගා කරන ප්‍රධාන රටවල්

රබර් වගාව ව්‍යාප්තියට බලපාන සාධක

- **27°C** ක උෂ්ණත්වය
- **2000mm** පමණ වර්ෂාපතනය
- තෙතමනය හොඳින් රඳාපවතින ලැටරයිට් හෝ කබොක් මිශ්‍ර රතු පස

වර්තමානයේ කාර්මික නිමැයුම් රාශියකට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයන්නේ රබර් ය

රබර් වගාව හා ඒ ආශ්‍රිත විශේෂ ලක්ෂණ

- රබර් වගාව විශාල වතු වශයෙන් ව්‍යාප්ත වී තිබීම
- ශ්‍රම සූක්ෂම වගාවක් වීම
- රබර් කිරි කැපීම හා එකතු කිරීම සඳහා මූලික වශයෙන් මිනිස් ශ්‍රමය භාවිතා වුවද මෑත කාලීනව නව තාක්ෂණික උපක්‍රම භාවිතා කිරීම
- රබර් අමුද්‍රව්‍ය ලෙස යොදා ගන්නා නිෂ්පාදන කර්මාන්ත රැසක් තිබීම නිසා අමුද්‍රව්‍යයක් ලෙස රබර් වලට ඇති ඉල්ලුම වැඩිවීම

රබර් වගාව හා ඒ ආශ්‍රිත විශේෂ ලක්ෂණ

- රබර් වගා කරන රටවල් අමුද්‍රව්‍ය අපනයනය කිරීම සමගම දේශීය වශයෙන් භාණ්ඩ නිෂ්පාදනයට යොමු වීම
- රබර් වගාකරන සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථිකයට එමගින් විශාල දායකත්වයක් ලැබීම
- කෘතිම රබර් වලින් එල්ලවන තරගය නිසා ස්වභාවික රබර් වලට වෙළඳපල ගැටලුවලට මුහුණ දීමට සිදු වීම

සත්ත්ව පාලනය

සත්ත්ව පාලනය යනු ආහාරමය අවශ්‍යතා සඳහා සහ කාර්මික අමුද්‍රව්‍ය සම්පාදනය සඳහා කෘෂිකාර්මික වටපිටාවක් යටතේ ගවයින් , බැටළුවන්, එළුවන්, ඌරන් වැනි සතුන් ඇති කරන භූමි පරිභෝග ක්‍රමයයි.

සත්ත්ව පාලනය යටතේ ඇති කරන සතුන්

- ❖ගවයින්
- ❖බැටළුවන්
- ❖එළුවන්
- ❖ඌරන්
- ❖කුකුළන්

විවිධ සතුන් හා එම සතුන්ගේ ප්‍රයෝජන



ව්‍යාපාරික කිරිපට්ටි පාලනය

ප්‍රෝටීන් අවශ්‍යතා සම්පූර්ණ කරන ප්‍රධාන ආහාරයකි, කිරි

ලෝකයේ සෞම්‍ය කලාපීය ප්‍රදේශවල කිරිපට්ටි පාලනය වැඩිව වශයෙන් ව්‍යාප්තව වීමට බලපෑ හේතු

- සිසිල් දේශගුණයක් පවතින වෙනත් වගාවන් සඳහා යොදාගගත නොහැකි ආන්තික බිම් බොහෝ දුරට කිරිපට්ටි පාලනය සඳහා යොදා ගැනේ.
- තණ බිම්වල ව්‍යාප්තිය
- ජල පහසුව
- පුහුණු ශ්‍රමය
- නව තාක්ෂණය හා වෙළෙඳපොළ

ලෝකයේ කිරිපට්ටි පාලනය කරන රටවල්

කිරි පට්ටි පාලනයේ විශේෂ ලක්ෂණ

- ❖ ලෝකයේ සංවර්ධිත රටවල් ව්‍යාපාරික කිරිපට්ටි පාලනයේ සියලු අංශයන්හි ප්‍රමුඛත්වය ලබා ගෙන සිටීම.
- ❖ කිරි ආශ්‍රිත වෙළෙඳපොළ සංවර්ධිත රටවල් විසින් පාලනයය කිරීම.
- ❖ කිරි ලබා ගැනීම, ප්‍රවාහනය හා ගබඩා කිරීමේදී මෙන්ම ලබාගන්නා කිරි ප්‍රමාණය වැඩි කිරීමට ද දියුණු ශිල්ප ක්‍රම භාවිත කිරීම.

  උදා: * කිරි දෙනුන්ට හෝමෝන එන්නත් කිරීම්

  * ජාන තාක්ෂණය මගින් වැඩියෙන් කිරි ලබා ගත හැකි දෙනුන් බෝ කිරීම
- ❖ දියර කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පුළුල් වීම.
- ❖ චීස්, බටර්, යෝගට් වැනි කිරි ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනය වැඩිවීම.

සවියෙන් පෙරට අපි එකට
e - ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
10	භූගෝල විද්‍යාව	2	3. ලෝකයේ ප්‍රධාන කෘෂි කාර්මික භූමි පරිභෝග වර්ග ඇගයීම

සැකසුම: නෙලූපා නුවංගනී ගමගේ
බප/හො/තක්ෂිලා මහා විද්‍යාලය

ලෝකයේ වී වගාව

1. කෘෂිකාර්මික භූමි පරිභෝගය යනු කුමක්ද?
2. කෘෂිකර්මයේ වටිනාකම අඩු නොවීමට හේතු මොනවාද ?
3. ආසියාවේ වී වගාවේ නියුතු ප්‍රධාන රටවල් 4ක් හා ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රධාන රටවල් 4ක් ලෝක සිතියමක ලකුණු කර නම් කරන්න.
4. වී වගාව සඳහා බලපාන භෞතික සාධක 4ක් නම් කරන්න.
5. වී වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ 4ක් නම් කරන්න.
6. ඓන්ද්‍රීය පොහොර භාවිතය කෙරෙහි වැඩි අවධානය යොමු වූ රටක් නම් කරන්න.
7. ජාන තාක්ෂණය භාවිතා කිරීමේ වාසි 2ක් සඳහන් කරන්න.
8. විශේෂ ගුණාංග සහිතව නිපදවන ලද සහල් වර්ගයක් නම් කරන්න

තිරිඟු වගාව

1. ලෝකයේ තිරිඟු වගා කරන ප්‍රධාන ප්‍රදේශ 4ක් ලෝක සිතියමක ලකුණු කර නම් කරන්න.
2. තිරිඟු වගාව සඳහා බලපාන ප්‍රධාන සාධක 3ක් නම් කරන්න.
3. තිරිඟු වගාවේ දියුණුවට බලපා ඇති මානුෂ සාධක 4ක් නම් කරන්න.
4. තිරිඟු වගාව ආශ්‍රිතව විශේෂ ලක්ෂණ 5ක් නම් කරන්න.
5. තිරිඟු නිෂ්පාදනය හා වී නිෂ්පාදනය ආශ්‍රිත සමාන ලක්ෂණ තුනක් හා වෙනස්කම් තුනක් නම් කරන්න.
6. ලෝක වෙළඳපොළෙහි තිරිඟු ප්‍රධාන භෝගයක් ලෙස වැදගත් වීමට හේතු 3ක් ලියන්න.
7. ලෝක ජනතාව අතර තිරිඟු ජනප්‍රිය වීමට හේතු මොනවාද?
8. වැඩි ඵලදාවක් සහිත තිරිඟු විශේෂයක් නම් කරන්න
9. තිරිඟු වැඩි ඵලදාවක් ලැබීමට භාවිත දියුණු තාක්ෂණික ශිල්ප ක්‍රම දෙකක් නම් කරන්න.

වතු කෘෂිකර්මය

1. වතු කෘෂිකර්මය යනු කුමක්ද?
2. වතු කෘෂිකර්මයේ විශේෂ ලක්ෂණ 4ක් නම් කරන්න.

තේ වගාව

1. තේ සොයාගත් රට කුමක්ද?
2. ලෝකයේ තේ වගාව ව්‍යාප්ත ප්‍රධාන රටවල් 4ක් ලෝක සිතියමක ලකුණු කර නම් කරන්න.
3. ලෝකයේ තේ වගා ව්‍යාප්තිය සඳහා බලපා ඇති සාධක 5ක් නම් කරන්න.
4. තේ වගාවේ විශේෂ ලක්ෂණ 4ක් නම් කරන්න.
5. තේ නිෂ්පාදනය වැඩි රටවල් අලෙවිය වැඩි කර ගැනීම සඳහා අනුගමනය කරන උපාය මාර්ග මොනවාද?

රබර් වගාව

1. රබර් වගාව කවර රටක උපත ලද භෝගයක්ද ?
2. ලෝක ස්වභාවික රබර් නිෂ්පාදනයෙන් 95% පමණ සපයනු ලබන කලාපය කුමක්ද?
3. රබර් වගාව සඳහා බලපාන ප්‍රධාන සාධක 3ක් ලියන්න
4. රබර් වගාවේ විශේෂ ලක්ෂණ 4ක් ලියන්න.
5. ලෝකයේ රබර් නිෂ්පාදනයට ප්‍රධාන වූ රටවල් 4ක් ලෝක සිතියමක ලකුණු කර නම් කරන්න.

ලෝකයේ සත්ත්ව පාලනය

1. ලෝකයේ පැරණිම භූමි පරිභෝග ක්‍රමය කුමක්ද?
2. සත්ව පාලනය යනු කෙටියෙන් හඳුන්වන්න.
3. සෞම්‍ය කලාපීය රටවල කිරිපට්ටි පාලනය ව්‍යාප්ත වීමට බලපෑ හේතු තුනක් සඳහන් කරන්න.
4. ලෝකයේ ව්‍යාපාරික කිරිපට්ටි පාලනය කෙරෙන රටවල් පහක් ලෝක සිතියමක ලකුණු කරන්න.
5. කිරි පට්ටි පාලනයේ විශේෂ ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න.

සවියෙන් පෙරට අපි එකට

***e* - ඉගෙනුම් පාසල**

හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
10	භූගෝල විද්‍යාව	2	3. ලෝකයේ ප්‍රධාන කෘෂි කාර්මික භූමි පරිභෝග වර්ග පිළිතුරු

සැකසුම: නෙලූපා නුවංගනී ගමගේ

බප/හො/තක්ෂිලා මහා විද්‍යාලය

<u>**ලෝකයේ වී වගාව**</u>

1. **මිනිසා විසින් කෘෂිකාර්මික කටයුතු සඳහා භූමිය පරිහරණය කිරීම කෘෂිකාර්මික භූමි පරිභෝගය ලෙස හඳුන්වයි.**
2. ලෝක ජනතාවට අවශ්‍ය ආහාර, එනම් භෝග වර්ග මෙන්ම සත්ව නිෂ්පාදනද, පානීය අවශ්‍යතාද සැපයීම.
    - දියුණුවන කාර්මික ක්ෂේත්‍රයට අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම.
    - ලෝක ජන සංඛ්‍යාවෙන් බහුතර සංඛ්‍යාවක් කෘෂි අංශයේ රැකියාවල නිරත වීම.
    - ලෝක වෙළඳාමේදී කෘෂි නිෂ්පාදන වැදගත් තැනක් ගැනීම
3.

3.1 සිතියම
ලෝකයේ වී වගා කරන ප්‍රධාන ප්‍රදේශ

4.
    - 27°C ක් පමණ උෂ්ණත්වය
    - 2000mm පමණ වර්ෂාපතනයක් ද
    - දියලු පස,
    - තැනිතලා ප්‍රදේශ

5.

- ❖ කුඩා ගොවි බිම්වල වී වගා කිරීම
- ❖ ඇතැම් රටවල ව්‍යාපාරික මට්ටමින් විශාල ගොඩබිම්වල වගා කිරීම
- ❖ ඉන්දියාව, ජපානය, ඇමරිකා එක්සත් ජන ජනපදය, චීනය, පකිස්තානය, තායිලන්තය, වියට්නාමය, වැනි රටවල් වාණිජ පදනමකින් වී වගා කිරීම
- ❖ ආසියාතික රටවල් බොහෝ විට ශ්‍රම සූක්ෂම වගාවක් වන අතර ආසියාවෙන් බැහැර ප්‍රදේශවල විශාල වශයෙන් යන්ත්‍ර සූත්‍ර භාවිත කිරීම, මෑතකාලීනව ආසියාවේද යන්ත්‍ර සූත්‍ර භාවිතයට ගැනීම
- ❖ වර්තමානයේ දී ජෛවීය පොහොර භාවිතය කෙරෙහි වැඩි අවධානයක් යොමුවීම.
- ❖ ජාන තාක්ෂණය උපයෝගී කොටගෙන විවිධ රෝග වලට ඔරොත්තු දෙන හා කෙටි කෙටිකාලීන අස්වැන්න ලබාදෙන බීජ වර්ග භාවිත කිරීම
- ❖ විශේෂ ගුණාංගවලින් යුත් සහල් නිෂ්පාදනය කිරීම

  සහල් ආශ්‍රිත විවිධ නිෂ්පාදන සැකසීම හා ඇසිරීම සඳහා නව ශිල්ප ක්‍රම භාවිතය

  බොහෝ විට සහල් වෙළදාම ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවලම සිදුවීම

6. ශ්‍රී ලංකාව
7. විවිධ රෝගවලට ඔරොත්තු දෙන බීජ නිපදවීම
   කෙටිකාලීන අස්වනු ලබා දෙන බීජ නිපදවීම
8. රන් සහල්

<u>තිරිඟු වගාව</u>

1.



2. 300mm – 500mm අතර වර්ෂාපතනය
   පැළ වැඩෙන කාලයේ සිසිල් තෙත් දේශගුණය
   හොඳින් ජලය බැසයන තැනිතලා බිම්
   චර්නෝසම් පස

3. ප්‍රාග්ධන ආයෝජනය කිරීමේ හැකියාව

නවීන තාක්ෂණය

යන්ත්‍ර සූත්‍ර භාවිතය

නව බීජ වර්ග භාවිතය

කෘමිනාශක සහ කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය

4. * විශාල වතු වශයෙන් ව්‍යාප්ත වීම හා මුළුමනින්ම ව්‍යාපාරික ස්වරූපයක් ගැනීම
 * වතු වගාවේ දී දේශීය ශ්‍රමය මෙන්ම විදේශීය ශ්‍රමයද භාවිතා වීම
 * පුහුණු ශ්‍රමය භාවිතා වීම හා විධිමත් ශ්‍රම සංවිධානය
 * කෘෂිකාර්මික ක්‍රමයක් වුවද කාර්මික ලක්ෂණ ද පෙන්නුම් කිරීම
 * විදේශ විනිමය ලබා දෙන අපනයන බෝග වීම
 * බොහෝ රටවල වතු කෘෂිකර්මය විදේශිකයන් විසින් ආරම්භ කර තිබීම

5.

තිරිඟු හා වී නිෂ්පාදන සමානතා	**තිරිඟු හා වී නිෂ්පාදන අසමානතා**
දියුණු තාක්ෂණය භාවිතා කිරීම	වී කුඩා බිම්වල හා තිරිඟු මහා පරිමාණයෙන් විශාල බිම්වල වගාකිරීම
විවිධ ආහාර වර්ග නිෂ්පාදනය කිරීම	වී වගාවට වඩා තිරිඟු සඳහා දියුණු යන්ත්‍ර උපකරණ බහුල වශයෙන් භාවිතා කිරීම
ආසියාවෙන් බැහැර ප්‍රදේශවල වී වගාවේ දී තිරිඟු වගාව මෙන්ම යන්ත්‍ර උපකරණ භාවිතය	තිරිඟු සඳහා ලොව පුරා පැතිරුණු වෙළඳපොලක් පැවතීම

6.

* බිම් ඒකකයකට ලැබෙන අස්වැන්න අඩු වුවද තිරිඟු වගා ප්‍රදේශවල ජන සංඛ්‍යාව අඩු වීම නිසා ඒක පුද්ගල අස්වනු ප්‍රමාණය වැඩි වීම.
* තිරිඟු ඒක බෝග වගාවක් වීම හා වගා බිම් විශාල වීම
* නිෂ්පාදනය වැඩි කර ගැනීම සඳහා දියුණු තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතය
* තිරිඟු සඳහා ලොව පුරා පැතිරුණු වෙළඳ පොළක් තිබීම
* වී වගාව හා සැසදීමේදී මහා පරිමාණ වශයෙන් යාන්ත්‍රීකරණයට භාජනය වීම
* වැඩි ඵලදාවක් සහිත තිරිඟු වර්ග භාවිතය
* විවිධාකාරයෙන් සැකසූ ආහාර ලෙස තිරිඟු පරිභෝජනය කිරීම

7.

* ලෝක වෙලදාම සම්බන්ධ වන ප්‍රධාන ධාන්‍ය වර්ගය වීම හා වැඩිපුරම භාවිතා වන ධාන්‍ය වර්ගය වීම
* අනෙකුත් ධාන්‍ය වලට වඩා තිරිඟු පිටි වලින් විවිධ ආහාර වර්ග සකස් කළ හැකි වීම
* උත්තරාර්ධ ගෝලයේ අස්වනු නෙලන කාලයක් දක්ෂිණාර්ධ ගෝලයේ අස්වනු නෙලන කාලයක් දෙකක් වීම නිසා වසර පුරා ම වෙළෙඳ පලට තිරිඟු සැපයිය හැකි වීම
* තිරිඟු වගා කෙරෙන රටවල අඩු ජනසංඛ්‍යාව නිසා ලෝක වෙලද පලට තිරිඟු වැඩිපුර සැපයිය හැකි වීම

8. නොරින් 10 තිරිඟු විශේෂය
9. * නවීන තාක්ෂණය
   * යන්ත්‍ර සූත්‍ර භාවිතය
   * නව බීජ වර්ග භාවිතය
   * කෘමිනාශක සහ කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය

<u>වතු කෘෂිකර්මය</u>

1. මනා සංවිධානයකින් හා කළමනාකාරීත්වයකින් යුක්තව පුහුණු ශ්‍රමය භාවිතා කරමින් අපනයනය මුල් කරගෙන විශාල වතු වල සිදු කෙරෙන බෝග වගාව වතු කෘෂිකර්මය ලෙස හැඳින්වෙයි .

2. * විශාල වතු වශයෙන් ව්‍යාප්ත වීම හා මුළුමනින්ම ව්‍යාපාරික ස්වරූපයක් ගැනීම
   * වතු වගාවේ දී දේශීය ශ්‍රමය මෙන්ම විදේශීය ශ්‍රමයද භාවිතා වීම
   * පුහුණු ශ්‍රමය භාවිතා වීම හා විධිමත් ශ්‍රම සංවිධානය
   * කෘෂිකාර්මික ක්‍රමයක් වුවද කාර්මික ලක්ෂණ ද පෙන්නුම් කිරීම
   * විදේශ විනිමය ලබා දෙන අපනයන බෝග වීම
   * බොහෝ රටවල වතු කෘෂිකර්මය විදේශිකයන් විසින් ආරම්භ කර තිබීම

<u>තේ වගාව</u>

1. චීනය
2.



3. 15°C - 27°C අතර උෂ්ණත්වය
1900mm 5400mm දක්වා වූ වාර්ෂික වර්ෂාපතනය,
ලෝම හා ලැටරයිට් පස,
මද බෑවුම් සහිත ප්‍රදේශ,
පුහුණු ශ්‍රමය

4. දිගු කාලයක් අස්වැන්න ලබා දෙන බෝගයක් වීම්
විශාල වතු හා කුඩා වතු ලෙස ව්‍යාප්තව පැවතීම
මනා කළමනාකාරිත්වයක් හා විධිමත් ක්‍රම සංවිධානයක් පැවතීම
අස්වැන්න වැඩික කර ගැනීම සඳහා විවිධ තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිත කිරීම
බීජ තේවලට වඩා රිකිලි තේ ගස ප්‍රචලිත වීම
විවිධ රසයෙන් හා අලංකාර ඇසුරුම් ඇසුරුම්වලින් වලින් යුතුව වෙළඳපොලට ඉදිරිපත් කිරීම

5. විවිධ රසයෙන් යුතු නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරිම
ඖෂධීය ගුණයෙන් යුතු නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරීම
ප්‍රචාරණයක් ලබා දීම
අලංකාර ඇසුරුම්වලින් යුත් නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරිම
නිෂ්පාදන සඳහා විවිධ වර්ණ භාවිතය
නිෂ්පාදනවල ගුණාත්මක බව වර්ධනය කිරීම

<u>රබර් වගාව</u>

1. බ්‍රසීලයේ
2. දකුණු හා අග්නිදිග ආසියානු රටවල් සපයයි
3. 27°C ක උෂ්ණත්වය
2000mm පමණ වර්ෂාපතනය
තෙතමනය හොඳින් රඳාපවතින ලැටරයිට් හෝ කබොක් මිශ්‍ර රතු පස

4. * රබර් වගාව විශාල වතු වශයෙන් ව්‍යාප්ත වී තිබිණි
* ශ්‍රම සූක්ෂම වගාවක් වීම්
*රබර් කර් කිරි කැපීම හා එකතු කිරීම සඳහා මූලික වශයෙන් මිනිස් ශ්‍රමය භාවිතා වුවද මෑත කාලීනව නව තාක්ෂණික උපක්‍රම භාවිතා කිරීම්
* රබර් අමුද්‍රව්‍ය ලෙස යොදා ගන්නා නිෂ්පාදන කර්මාන්ත රැසක් තිබීම නිසා අමුද්‍රව්‍යයක් ලෙස රබර්
වලට ඇති ඉල්ලුම වැඩිවීම
* රබර් වගා කරන රටවල් අමුද්‍රව්‍ය අපනයනය කිරීම සමගම දේශීය වශයෙන් භාණ්ඩ නිෂ්පාදනයට
යොමු වීම
* රබර් වගාකරන සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථිකයට එමගින් විශාල දායකත්වයක් ලැබීම
* කෘතිම රබර් වලින් එල්ලවන තරගය නිසා ස්වභාවික රබර් වලට වෙළඳපල ගැටලුවලට මුහුණ දීමට සිදු වීම

5.

3.4 සිතියම
ලෝකයේ රබර් වගා කරන ප්‍රධාන රටවල්

ලෝකයේ සත්ත්ව පාලනය

1. සත්ත්ව පාලනය

2. සත්ත්ව පාලනය යනු ආහාරමය අවශ්‍යතා සඳහා සහ කාර්මික අමුද්‍රව්‍ය සම්පාදනය සඳහා කෘෂිකාර්මික වටපිටාවක් යටතේ ගවයින් , බැටළුවන්, එළුවන්, ඌරන් වැනි සතුන් ඇති කරන භූමි පරිභෝග ක්‍රමයයි.

3. * සිසිල් දේශගුණයක් පවතින වෙනත් වගාවන් සඳහා යොදාගගත නොහැකි ආන්තික බිම් බොහෝ දුරට කිරිපට්ටි පාලනය සඳහා යොදා ගැනේ.
   * තණ බිම්වල ව්‍යාප්තිය
   * ජල පහසුව
   * පුහුණු ශ්‍රමය
   * නව තාක්ෂණය හා වෙළෙඳපොළ

4.

5.

* ලෝකයේ සංවර්ධිත රටවල් ව්‍යාපාරික කිරිපට්ටි පාලනයේ සියලු අංශයන්හි ප්‍රමුඛත්වය ලබා ගෙන සිටීම
* කිරි ආශ්‍රිත වෙළෙඳපොළ සංවර්ධිත රටවල් විසින් පාලනයය කිරීම
* කිරි ලබා ගැනීම, ප්‍රවාහනය හා ගබඩා කිරීමේදී මෙන්ම ලබාගන්නා කිරි ප්‍රමාණය වැඩි කිරීමට ද දියුණු ශිල්ප ක්‍රම භාවිත කිරීම

නිදසුන්   කිරි දෙනුන්ට හෝමෝන එන්නත් කිරීම්

* ජාන තාක්ෂණය මගින් වැඩියෙන් කිරි ලබා ගත හැකි දෙනුන් බෝ කිරීම
* දියර කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පුළුල් වීම
* චීස් බටර් යෝගට් වැනි කිරි ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනය වැඩිවීම

10 ශ්‍රේණිය- භූගෝල විද්‍යාව

ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග -01

- වී
- තිරිඟු

(2021)

O.Level Geography

kokila gunawardana

ඈත අතීතයේ සිට ම මිනිසුන් ආහාර නිපදවා ගැනීම සඳහා කෘෂිකර්මාන්තයෙහි නිරත විය. කෘෂිකර්මය සඳහා භූමිය යොදා ගැනීම කෘෂිකාර්මික භූමි පරිභෝගය (Agricultural land utilization) ලෙස හැඳින්වේ. ,

කෘෂිකාර්මික භූමි පරිභෝගයේ වර්ග

- පාරිභෝගික කෘෂි භූමි පරිභෝගය
- ව්‍යාපාරික කෘෂි භූමි පරිභෝගය

අතීතයේ සිට මේ දක්වා කෘෂිකර්මාන්තයෙහි වටිනාකම අඩුවී නොමැත.

- ලෝක ජනතාවට අවශ්‍ය ආහාර, එනම් භෝග වර්ග මෙන් ම සත්ත්ව නිෂ්පාදනද පානීය අවශ්‍යතා ද සැපයීම.



අතීතයේ සිට මේ දක්වා කෘෂිකර්මාන්තයෙහි වටිනාකම අඩුවී නොමැත.

❖ දියුණුවන කාර්මික ක්ෂේත්‍රයට අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම.

අතීතයේ සිට මේ දක්වා කෘෂිකර්මාන්තයෙහි වටිනාකම අඩුවී නොමැත.

- ලෝක ජනසංඛ්‍යාවෙන් බහුතර සංඛ්‍යාවක් කෘෂි අංශයේ රැකියාවල නිරතවීම.

අතීතයේ සිට මේ දක්වා කෘෂිකර්මාන්තයෙහි වටිනාකම අඩුවී නොමැත.

❖ලෝක වෙළෙඳාමේ දී කෘෂි නිෂ්පාදන වැදගත් තැනක් ගැනීම යනාදිය දැක්විය හැකි ය.

වී වගාව

වී, ආසියානු රටවල බහුතර ජනතාවකගේ ප්‍රධාන ආහාරය වන බත සපයන භෝගය යි. නිෂ්පාදනය කරනු ලබන ප්‍රදේශ තුළ ම පරිභෝජනය කිරීම වී වගා කරන ආසියානු ප්‍රදේශවල විශේෂ ලක්ෂණයකි. ලෝකයේ වී වගා කරන ප්‍රධාන ප්‍රදේශ දෙකක් හඳුනාගත හැකි ය. එනම්, ආසියාවේ වී වගා කරන ප්‍රදේශ හා ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශ ව

වී වගා කරන ප්‍රදේශ

01. ආසියාවේ වී වගා කරන ප්‍රදේශ (ප්‍රධාන රටවල්)

- ❖ තායිලන්ත
- ❖ චීනය
- ❖ ඉන්දියාව
- ❖ ඉන්දුනීසියාව
- ❖ ජපානය
- ❖ පකිස්තානය
- ❖ බංග්ලාදේශය
- ❖ මියන්මාරය
- ❖ ශ්‍රී ලංකාව

02. ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශ

- ❖ ඉතාලියේ පෝ ගංගා නිම්නය
- ❖ අප්‍රිකාවේ නයිල් ඩෙල්ටා
- ❖ උතුරු ඇමරිකාවේ මිසිසිපි හා සැක්‍රමැන්ටෝ නිම්නය
- ❖ ඕස්ට්‍රේලියාවේ මරේ ඩාලිං ගංගා නිම්නය
- ❖ මැඩගස්කරය



ලෝකයේ වී වගා කරන ප්‍රධාන ප්‍රදේශ

kokila gunawardana

වී වගාව -භෞතික සාධක



උෂ්ණත්වය, → 27 ^{o}C පමණ උෂ්ණත්වය

වර්ෂාපතනය, → 2000mm පමණ වර්ෂාපතනය



පස → දියළු පස (alluvial soil)

භූමිය → තැනිතලා ප්‍රදේශ

වර්ෂා ජලයෙන් මෙන් ම වාරි ජල සම්පාදනය මගින් ද මෙම ප්‍රදේශවල වී වගාව සිදු කෙරේ.

කඳුකර බිම්වල ද හෙල්මළු ක්‍රමයට (terrace method) වී වගා කරනු ලැබේ.

වී වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ

- කුඩා ගොවිබිම්වල වී වගා කිරීම.
- ඇතැම් රටවල ව්‍යාපාරික මට්ටමින් විශාල ගොවිබිම්වල වගා කිරීම.
  - ඉන්දියාව, ජපානය, ඇමරිකා එක්සත් ජනපදය, චීනය, පකිස්තානය, තායිලන්තය, වියට්නාමය වැනි රටවල් වාණිජ පදනමකින් වී වගා කිරීම.
- ආසියාතික රටවල බොහෝ විට ශ්‍රම සූක්ෂම වගාවක් (labour intensive cultivation) වන අතර ආසියාවෙන් බැහැර ප්‍රදේශවල විශාල වශයෙන් යන්ත්‍රසූත්‍ර භාවිත කිරීම. මෑත කාලීන ව ආසියාවේ ද යන්ත්‍ර සූත්‍ර භාවිතයට ගැනීම.
- වර්තමානයේ දී ඓන්ද්‍රීය පොහොර (organic fertilizer) භාවිතය කෙරෙහි වැඩි අවධානයක් යොමු වීම. නිදසුන් :- ශ්‍රී ලංකාව

වී වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ

- ජාන තාක්ෂණය (gene technology) උපයෝගි කොට ගෙන විවිධ රෝගවලට ඔරොත්තු දෙන හා කෙටිකාලීන අස්වැන්න ලබා දෙන බීජ වර්ග භාවිත කිරීම.
- විශේෂ ගුණාංගවලින් යුත් සහල් නිෂ්පාදනය කිරීම.

නිදසුන් :- රන් සහල් (golden rice)

- සහල් ආශ්‍රිත විවිධ නිෂ්පාදන සැකසීම හා ඇසිරීම සඳහා නව ශිල්ප ක්‍රම භාවිතය

නිදසුන් :- සහල් පිටි, පාන් හා බිස්කට් යනාදී නිෂ්පාදන

- බොහෝ විට සහල් වෙළෙඳාම, ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල ම සිදු වීම.

තිරිඟු වගාව

ලොව වැඩි වශයෙන් නිෂ්පාදනය හා
කරන ධාන්‍ය වර්ග අතුරින් තිරිඟුවලට
අද්විතීය ස්ථානයකි. ලොව ජනතාවගෙන් බහුතරයක්
තිරිඟු ප්‍රධාන ආහාරයක් ලෙස භාවිත කරති. මේ
නිසා ම මහා පරිමාණ ගොවිපොළවල ව්‍යාපාරික
මට්ටමින් තිරිඟු වගා කරනු දකිය හැකි ය.

තිරිඟු විවිධාකාරයෙන් සකස් කොට මිනිස්
පරිභෝජනය සඳහා භාවිත කරන අතර අතුරුඵල
සත්ත්ව ආහාර ලෙස ද භාවිතයට ගැනේ.

ලෝකයේ තිරිඟු වගා කරන ප්‍රධාන රටවල්



ප්‍රධාන රටවල් කිහිපයක තිරිඟු නිෂ්පාදනය 20092010

මූලාශ්‍රය *http//spotonlists.com*

තිරිඟු වගාව - භෞතික සාධක

උෂ්ණත්වය, → 21 - 24°C පමණ උෂ්ණත්වය

වර්ෂාපතනය, → 300mm - 500mm පමණ වර්ෂාපතනය



පස → චර්නෝසම් පස(chernozem soil)

භූමිය → තැනිතලා ප්‍රදේශ (හොඳින් ජලය බැස යන)

දේශගුණය → පැළ වැඩෙන කාලයේ සිසිල් තෙත් දේශගුණය

තිරිඟු වගාව - මානව සාධක

- ප්‍රාග්ධනය ආයෝජනය කිරීමේ හැකියාව,
- නවීන තාක්ෂණය හා යන්ත්‍ර සූත්‍ර භාවිතය,
- නවීන බීජ වර්ග භාවිතය,
- කෘමිනාශක හා කෘෂිරසායන ද්‍රව්‍ය භාවිතය

වැනි හේතු ද තිරිඟු වගාවේ දියුණුවට බලපා ඇත.

තිරිඟු වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ

- බිම් ඒකකයකට ලැබෙන අස්වැන්න අඩු වුව ද තිරිඟු වගා ප්‍රදේශවල ජනසංඛ්‍යාව අඩු වීම නිසා ඒක පුද්ගල අස්වනු ප්‍රමාණය වැඩි වීම.
- තිරිඟු, ඒක භෝග වගාවක් (monoculture) වීම හා වගා බිම් විශාල වීම

තිරිඟු වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ

- ❖ නිෂ්පාදනය වැඩි කර ගැනීම සඳහා දියුණු තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතය

  නිදසුන්:- ජාන තාක්ෂණය, පාංශු සංරක්ෂණ ක්‍රම යනාදිය



තිරිඟු වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ

❖ තිරිඟු සඳහා ලොව පුරා පැතිරුණු වෙළෙඳපොළක් තිබීම.

❖ වී වගාව හා සැසඳීමේ දී මහා පරිමාණ වශයෙන් යාන්ත්‍රීකරණයට භාජනය වීම.

❖ වැඩි ඵලදාවක් සහිත තිරිඟු වර්ග භාවිත කිරීම.

නිදසුන්:- නොරින් - 10 (තිරිඟු විශේෂයකි)

❖ විවිධාකාරයෙන් සැකසූ ආහාර ලෙස තිරිඟු පරිභෝජනය කිරීම.